# 1.18 කාල්පනික සත්ත්ව රූප භාවිතය ගම්පොළ යුගයේ සුවිශේෂ කලා ප්‍රකාශනයකි.

එච්.එම්.එස්.එච්.එම්. බණ්ඩාර මයා
නො: 110 සී, ජා-ඇල පාර, අඹන්විට, ගම්පහ.

## ABSTRACT

මිනිසා සහ සත්ත්වයා අතරැති සම්බන්ධතාව වසර දස දහස් ගණනක් පැරණිය. ලෝකයේ විවිධ සංස්කෘතීන්හි කලා ප්‍රකාශනයන් සඳහා විවිධ අයුරින් කාල්පනික සත්ත්ව රූප යොදා ගැනීම නූතනය දක්වා අඛණ්ඩව ගලා එන්නකි. කාල්පනික ලෝකයක හැඩ ඇසුරින් මැවෙන සත්ත්ව රූප ප්‍රකාශන මූර්ති කලාවෙහි ප්‍රකටය.

ශ්‍රී ලාංකේය දෘශ්‍ය කලා ඉතිහාසයේ මූර්ති කලා අංග අතර වඩාත් විශේෂිත ලෙස කාල්පනික සත්ත්වයින් භාවිතා වී ඇත්තේ ගම්පොළ යුගයේදීය. (ක්‍රි. ව. 1341-1415) ආගමික ස්ථාන ප්‍රධාන කොට ගනිමින් භාවිතව ඇති මෙම මූර්ති ප්‍රකාශනයන් කාල්පනික හා මිථ්‍යා අදහස් ඇසුරින් ගොඩ නගන ලද බව කිව හැකිය. කාල්පනික යනු කල්පිත, මනඃකල්පිත, සිතෙහි ඇතිවන යන තේරුම් ගෙන දෙයි. මිථ්‍යා යනු පුරාවෘත්ත, පුරාණෝක්ති, මිථ්‍යා ප්‍රබන්ධ ආදියයි. ගම්පොළ යුගයේ මූර්ති ශිල්පියා කාල්පනික මූර්ති සංරචන ගොඩනංවා ඇත්තේ කාල්පනිකත්වය සමඟ මිථ්‍යාමය සංකල්පයන්ද ඇසුරු කරමින් බව පෙනේ. ගෘහ අලංකරණය සඳහා මේ මූර්ති භාවිතව ඇත.

ගඩලාදෙණිය, අලවතුර, අළුදෙණිය, හොරණ හා දෙවුන්දර ප්‍රධාන වශයෙන් එම රූපමය සංරචන හමුවන ස්ථානයන්ය.

එම ක්ෂේත්‍රයෙහි දැකිය හැකි කාල්පනික සත්ත්ව රූප අතර ගජසිංහයා, සෙරපෙන්දියා, භේරුණ්ඩ පක්ෂියා, ඇත්කඳ ලිහිණියා, කිඳුරු රුව නිර්මාණශීලී සංකල්ප ලෙස කැපී පෙනේ. මෙම බොහෝ රූප රචනා මීට පෙර යුගයන්හි මෙලෙස දැකිය නොහැකි වීම මෙහිදී සැලකිය යුතුවේ.

සුවිශේෂ කලා ප්‍රකාශන ලෙස ඒවා යොදා ගැනීමේදී පහත කාරණා බලපා ඇතැයි නිගමනය කළ හැක.

- ආගමික බලය හෝ ශක්තිය පිළිබඳ අදහසක් කාල්පනික හැඩ ඇසුරින් ඉදිරිපත් කිරීම. (සත්ත්ව රූප භාවිතයේ මුල් කාලීන මානව අවශ්‍යතාව වූයේ ප්‍රධාන වශයෙන් අදෘශ්‍යමය බලවේගයන් පිළිබඳ මිනිසුන් තුළ වූ අදහසට රූපයක් හැඩයක් දීමේ උවමනාවය. එය ආගමික බලය පිළිබඳ ප්‍රකාශනයක්ද විය.)
- දිව්‍යමය බව පිළිබඳ හැඟීම හා එම කාල්පනික ලෝකයේ හැඩය දෘශ්‍ය ප්‍රකාශන ලෙස බැතිමතා වෙත ඉදිරිපත් කිරීමට ගත් උපක්‍රමික ලක්ෂණය
- ප්‍රධාන වාස්තු විද්‍යාත්මක සැලසුමට අනුකූලව මූර්තිමය ප්‍රකාශනයන් ස්ථානගත කිරීමේදී ශිල්පීන්ගේ දැනුම හා නිර්මාණ ශෛලීය ක්‍රමවේද ඒ හා ගලපා ගැනීමට ගත් උත්සාහය
- මෙතෙක් අනුගමනය කළ නිර්මාණකරන ක්‍රමවේදයන්ට වෙනස් වූ නිදහස් ප්‍රකාශන විධි ක්‍රමයක් අනුගමනය කිරීම.

බෞද්ධ හා හින්දු ආගමික සංකල්ප හා ශෛලීය ලක්ෂණ සම්ශ්‍රව නිමවා ඇති මෙම රූප රචනා ගම්පොළ යුගයෙහි වඩාත් අවධානය ගන්නා කලා ප්‍රකාශනයන් ලෙස ලාංකේය මූර්ති කලා ඉතිහාසයෙහි කැපී පෙනේ.